**උඩුනුවර ප්‍රාදේශීය සභාව - 2022**

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් 31 ක් විසින් සභාව වෙත සහ සභාව විසින් බාහිර පාර්ශව 08 කට නඩු පවරා තිබුණ ද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නඩු සම්බන්ධව හෙළිදරව් කළ යුතුය |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීමට වැය කර තිබුණු රු.81,232,564 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමට වැය කළ රු.7,070,462 ක මුදල ප්‍රාග්ධනිත කර ඇත. ඉතිරි ඉදිකිරීම් සඳහා වැය වූ මුදල් 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව | ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කළ යුතුය |
| (ආ) | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලේ හිඟය පියවීමට ගෙවූ රු.594,918 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී, සභා අරමුදල් මගින් ආධාර ලබා දීම සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලැබී නොතිබුණු ව්‍යාපෘති 67 ක් සඳහා රු.5,129,500 ක් හා පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ඇණවුමක් හෝ ලබා නොගෙන රු.600,000 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මෙම ව්‍යාපෘති ආණ්ඩුකාර අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අතර, අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බැවින්, එම යෝජනා ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඈ) | ඉකුත් වර්ෂවල වැඩ අවසන් කර ගෙවීම් සිදු කළ ව්‍යාපෘති 33 කට අදාළ එකතුව රු.1,593,364 ක් තවදුරටත් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම තුළින් නිවැරදි කරන බව | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 1994 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළ ඉකුත් තැන්පතු රු.446,656 ක් ආදායමට ගැනීමේ දී, සමුච්චිත අරමුදලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | මෙවැනි දෝෂ සිදු නොවීමට වග බලා ගන්නා බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඊ) | මු.රෙ. 104(04) පරීක්ෂණ වාර්තාව අනුව, ක්ෂේත්‍රයේ දී ආදායම් රැස් කිරීමේ දී, සිදු කළ වංචාවට අදාළ ව පාර්ශවකරුවන් 04 දෙනෙකුගෙන් අය කළ යුතු රු.151,350 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වංචා කර ඇති මුදල් නිවැරදිව හඳුනා ගෙන ගැලපීම් කරන බව | ලැබිය යුතු ගිණුම් හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |

1.6.3 **නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයන් 03 ක් හා බැරකම් විෂයන් 03 කට අදාළ උපලේඛනවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීමේ දී, රු.31,147,304 ක නොසැසඳීමක් විය. | මෙම ශේෂයන් නිවැරදිව ගැලපීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

1.6.4 **අවිනිශ්චිත ගිණුම්**

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු.594,742 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | රු.594,742 ක අවනිශ්චිත ගිණුමේ ශේෂය ඉදිරියේ දී නිරවුල් කරන බව | අඩුපාඩු හඳුනා ගෙන අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය |

1.6.5 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.9,315,416 ක් වූ ගිණුම් ශේෂ 03 ක් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ස්ථාවර වත්කම් මේ වන විට හඳුනා ගෙන ලේඛනගත කිරීමට කටයුතු කර ඇති අතර, දීර්ඝ කාලීන තැන්පතු සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගෙන යා යුතුය. |
| **(ආ)** | 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් ආදායම් එකතු කිරිම සඳහා හඳුන්වා දී තිබුණු මෘදුකාංගය අවභාවිතා කර වරිපනම් බදු ගෙවන පුද්ගලයින්ගෙන් මුදල් ලබා ගෙන සහා ආදායමට බැර නොකර විෂය භාරකරු විසින් රු.1,028,451 ක මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් 2018 වර්ෂයේ දී, අවසන් පරීක්ෂණය සිදු කර ඇතත්, මේ වන තෙක් වංචාවට ලක් වූවන්ගේ කේවළ | වංචාවට හසු වූ රිසිට්පත් මේ වන විටත් බදු ගෙවන්නන් විසින් ඉදිරිපත් කිරීම මත මෙම හිඟය සම්බන්ධව නිශ්චිතව තීරණය කිරීම පමා වී ඇති බව | හිඟ ශේෂය නිවැරදි කර ගත යුතුය |

ශේෂයන් නිවැරදි කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.35,331,051 ක හිඟ වරිපනම් ශේෂයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ද නොහැකි විය.

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කාර්යයසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා කාර්යයසාධන වාර්තාවක් සකස් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 127 වගන්තිය | සභාව විසින් භාවිතයට ගනු ලබන සුසාන භූමි 66 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | සභා බල ප්‍රදේශයේ සුසාන භූමිවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 115 | වැලි, කොන්ක්‍රීට් කණු, කටු කම්බි සහ පුස්තකාල පොත් යනාදී භාණ්ඩ මිලදී ගැනීමේ දී භාණ්ඩ ලැබුණු බවට හා ඉන්වෙන්ට්‍රි පොත්, තොග පොත්වල ඇතුළත් කළ බවට සහතික නොතිබිය දී, ගෙවීම් වවුචර් 08 කින් රු.872,264 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | අවශ්‍ය සහතික අදාළ වවුචර්වලට අමුණා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,739,458 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,643,798 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,156,000 | 12,978,577 | 9,803,046 | 35,615,728 | 12,793,800 | 12,373,206 | 8,638,896 | 32,440,197 |
| (ii) | කුලී | 3,770,000 | 32,184,265 | 13,747,785 | 18,729,330 | 2,585,000 | 552,100 | 452,130 | 292,850 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,450,000 | 2,989,008 | 2,702,508 | 994,300 | 3,000,500 | 1,566,709 | 1,566,708 | 707,800 |
| (iv) | වෙනත් ආදායම් | 22,114,750 | 52,309,537 | 88,717,013 | 37,053,107 | 64,765,500 | 64,631,971 | 72,588,256 | 73,460,583 |
| | එකතුව | 41,490,750 | 100,461,387 | 114,970,352 | 92,392,465 | 83,144,800 | 79,123,986 | 83,245,990 | 106,901,430 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>වරිපනම් ඒකකයක හිඟය රු.10,000 ට වැඩි දේපළ 593 කින් අය විය යුතු එකතුව රු.10,317,312 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් හිඟ අය කර ගැනීමට 2023 වර්ෂයේ දී දැඩි අවධානය යොමු කරන බව | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **අක්කර බදු**<br>2015 වර්ෂයේ සිට හිඟව පවතින දේපළ 196 කින් අය විය යුතු රු.202,996 ක අක්කර බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තවදුරටත් අක්කර බදු හිඟ ඉඩම්වලින් එම මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ බදු අය කිරීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | **ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම**<br>ඉකුත් වර්ෂයට අදාළව ත්‍රී රෝද රථ 464 කින් රු.556,800 ක ගාස්තු අය කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ ලිඛිත අවසර ලබා ගැනීමට සිදුවීම හා එම අවසර ලබා ගැනීමට ප්‍රමාද වීම මත මෙම අය කිරීම් ප්‍රමාද වී ඇති බව | ආදායම් අය කර ගත යුතුය |
| (ඈ) | **දැන්වීම් පුවරු පරීක්ෂාව**<br>සමාලෝචිත වර්ෂයේ දී, ආයතන 19 ක ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 18 ක් වාර්ෂික සමීක්ෂණයේ දී හඳුනා ගෙන නොතිබුණු අතර, ඒ සඳහා රු.83,470 ක ආදායමක් අය කර ගෙන නොතිබුණි. | මෙම දැන්වීම් පුවරු සඳහා මුදල් අය කිරීම හෝ අය කර නොතිබීම සම්බන්ධව නිශ්චිත තොරතුරක් ඉදිරිපත් කළ නොහැකි බව | ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.30,189,796 ක් විය. | මුදල් ලබා ගැනීමට අදාළ ආයතන වෙත ඉල්ලීම් කොට මුදල් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව | හිඟ මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය |

2.3 **අධිභාර**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,020,364 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. | මෙම අධිභාරයට අදාළ එක් නිලධාරියෙකු බන්ධනාගාර ගත කර ඇති බවත්, අනෙක් නිලධාරීන් අභියාචනා කර ඇති බව | අධිභාර අය කළ යුතුය |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 22 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 17 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | බල ප්‍රදේශයේ අවශ්‍යතාවය අනුව, අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කුරුඳුවත්ත එස්ටේට් නමැති ඉඩම විකිණීමෙන් වෙන්දේසිකරු ලබා දුන් තක්සේරුව පදනම් කර ගෙන සියයට 01 ක් බදු ලබා ගෙන තිබුණ ද, විකුණුම් වටිනාකමේ ඉතිරි බදු මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුරුඳුවත්ත එස්ටේට් නැමැති ඉඩම විකිණීමෙන් සියයට 01 බද්ද එම ඉඩම විකුණුම් මිලෙන් ලබා ගැනීම සඳහා අදාළ ආයතන මේ වන විට දැනුවත් කර ඇති බව | බදු මුදල් අය කර ගත යුතුය |
| (ආ) | ගෙලිඔය පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 15 ක් බදු දීමේ දී, අය කළ යුතු රු.21,420,000 ක එක්වන් මුදලින් සමාලෝචිත වර්ෂයට අදාළව අය කළ යුතු රු.749,780 ක මුදල හා ශේෂයට අදාළ රු.1,891,881 ක පොලී සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අය කර නොතිබුණි. | නීත්‍යානුකූලව අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට සභාවේ නීතිඥ මහතා වෙත යොමු කර ඇති බව | කඩ කාමර කුලී අය කර ගත යුතුය |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.13,476,975 ක් වූ අතර, එයින් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.6,299,373 ක් විය. | ඉල්ලීම් ලිපි හා සිහි කැඳවීම් මේ වන විට යොමු කර ඇත. ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ අය කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 03 ක එකතුව රු.31,553,216 ක් වූ අතර, එයින් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.8,410,133 ක් ද, වසර 05 ක් ඉක්මවා තිබුණු ශේෂ එකතුව රු.909,356 ක් විය. | පරීක්ෂා කර බලා නිවැරදි කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය |

3.3 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව සතු රු.5,503,000 ක වාහන 08 ක් වසර 03 ත් 10 ත් අතර කාලයක සිට නිෂ්කාර්යයව පැවතුණි. | වාහන 03 ක් අලුත්වැඩියාවට ද, වාහන 03 ක් වෙන්දේසියට ද, වාහන 02 ක් වෙනත් ආයතන වෙත ලබා දීමට ද කටයුතු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |
| (ආ) | නළ ළිං ගබඩාවේ එකතුව රු.424,463 ක චලනය නොවන තොග ශේෂයක් පවතින අතර, එම තොගය භාවිතයට ගැනීමට හෝ වෙනත් ප්‍රයෝජනයකට ගත හැකි ආයතනයකට ලබා දීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම උපකරණ ජල සම්පාදන මණ්ඩලය වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු යෙදුව ද, ජල සම්පාදන මණ්ඩලය වෙත මෙම උපකරණවල අවශ්‍යතාවයක් නොමැති බව දන්වා ඇත | අපහරණය කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

3.4 **වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **පවරා නොගත් වත්කම්** | | |
| (අ) | සභාවට අයත් ඉඩම් 67 ක් හා නළ ළිං හා පොදු ළිං පිහිටි ඉඩම් කොටස් 50 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | සුසාන භූමි හා ඉඩම් මැනුම් කටයුතු කර පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | කිරිවවුල මානෙල් අංග කසළ කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 01, රූඩ් 01, පර්චස් 26.69 ක භූමි ප්‍රමාණයක් සහිත ඉඩමේ අයිතිය පවරා ගෙන නොතිබුණි. | මෙම සභාවට අයත් මානෙල් අංග කසල අංගනය පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු කරන බව | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

3.5 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.9,456,954 ක ප්‍රාග්ධන වියදමක් පැවතිය ද, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර, ඒ අනුව කටයුතු කළ යුතුය |

3.6 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඕවලදෙණිය උලක්කෙණ්ඩ ප්‍රජාශාලාව ඉදිකිරීම - රු.1,431,895** | | |
| i. | බිල්පත අනුව, වැඩ විෂය 01 යටතේ බිත්ති බැඳීම (Masonry Block Work) සඳහා මි.මී. 150 ඝනකමකින් යුත් සිමෙන්ති ගල් භාවිතා කිරීමට ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබුණ ද, එම ඉදිකිරීම සඳහා මි.මී.100 ක ප්‍රමාණයේ සිමෙන්ති ගල් යොදා තිබීම හේතුවෙන්, රු.95,634 ක් පිරිවිතරයෙන් බැහැර ඉදිකිරීම් සඳහා ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති රු.95,634 ක මුදල අතරැදි මුදලින් අය කර ගැනීමට කටයුතු කරමි. අතරැදි මුදල් මෙතෙක් නිදහස් කර නොමැති බව | ඇස්තමේන්තු ගත ප්‍රමිතියට අනුව වැඩ ඉටු කරවා ගත යුතුය |
| ii. | බිල්පත්‍ර අනුව, වැඩ විෂය අංක 03 සහ 04 යටතේ ඇලුමිනියම් දොර සහ ජනේල සඳහා රු.460,194 ක් ගෙවා තිබුණ ද, ගොඩනැගිලි රේට විග්‍රහයේ K 001 හා K 010 අංකය යටතේ සඳහන් ඇලුමිනියම් 10 – 15 මයිකෝන් ක්ලැඩින් බෝඩ්වලින් පිරිවිතරවල සඳහන් ආකාරයට එම ඉදිකිරීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, රු.466,194 ක් පිරිවිතරයන්ගෙන් බැහැර ඉදිකිරීම් සඳහා ගෙවා තිබුණි. | පිරිවිතරවල සඳහන් පරිදි නිවැරදි කරන ලෙස සමිතිය දැනුවත් කර ඇති බව | බිල්පත් නිර්දේශ කළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | **මාණික්කාව නෝනාවත්ත මාර්ගය ඉදිකිරීම - රු.1,199,826** | | |
| i. | වැඩ විෂය අංක 01 මඟින් මාර්ගයට ABC ඇතිරීම සඳහා ඝන මීටරයකට රු.6,070 ක් බැගින් ඝන මීටර් 23.07 ක් සඳහා රු.144,890 ක් හා ABC ප්‍රවාහනය සඳහා ඝන මීටරයකට රු.1,736 ක් බැගින් ඝන මීටර් 23.92 කට රු.41,525 ක් වැය කර තිබුණි. මාර්ගයේ මීටර් 0.150 ක් ඝනකමට ABC ඇතිරිය යුතු වුවත්, මාර්ගයේ ස්ථාන 03 ක් පරීක්ෂාවේ දී, මීටර් 0.050 ක් ඝනකමට ABC අතුරා ඇති බවක් නිරීක්ෂණය විය. | ABC මීටර් 23.07 ක් සඳහා රු.144,890 ක් වැය කර ඇත. අතරැදි රු.119,983 ක මුදල හා කොන්ත්‍රාත්කරු වෙතින් රු.24,907 ක් අය කර ගැනීමට කටයුතු කරන බව | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |
| ii. | මීටර් 0.150 ක් ඝනකමට ABC යොදන ලද මෙම මාර්ගයේ ABC තට්ටුවේ ඝනකම පරීක්ෂා කිරීමේ පරීක්ෂණ (Field Density Test) සිදු කර නොතිබීමෙන්, මෙම මාර්ගයට යොදන ලද ABC ප්‍රමාණය සනාථ කිරීමට නොහැකි විය. | මින් ඉදිරියට අදාළ වන සෑම කර්මාන්තයක් සඳහාම පරීක්ෂණ සිදු කිරීමට තරයේ කටයුතු කරන බව | ABC කම්ටුවේ ඝනකම පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | **දඹලන්ද දුනුගහමුල සිට වතුපොළ දක්වා මාර්ගය සංවර්ධනය**<br>ඉකුත් වර්ෂයේ සභා අරමුදල් මඟින් දඹලන්ද දුනුගහමුල සිට වතුපොළ දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වට්ටප්පොල ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.198,347 කට ගිවිසුම්ගතව ඉදිකිරීම් පවරා ව්‍යාපෘතිය නිම කර තිබුණු බව ලිපිගොනුවේ දක්වා තිබුණි. එසේ වුව ද, භෞතික පරීක්ෂාවේ දී, එම මාර්ගය සංවර්ධනය නොකර, අනුමැතියකින් තොරව නිවසක් දෙසට වූ පෞද්ගලික මාර්ගයක් සංවර්ධනය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව | අනුමත කරන ලද ව්‍යාපෘතිය ඉටු කළ යුතුය |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේ දී, තනතුරු 13 ක පුරප්පාඩු 26 ක් හා එක් තනතුරක අතිරික්තතා 14 ක් පැවතුණි. | සංවර්ධන නිලධාරී තනතුරු 14 ක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් මෙම සභාවට පත් කර එවා ඇති අතර, සභාවේ සියලු පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය |
| (ආ) | **සේවක ණය**<br>විශ්‍රාම ගිය, මිය ගිය හා සේවය අත හැර ගිය නිලධාරින් 17 දෙනෙකුගෙන් එකතුව රු.1,204,482 ක ණය ශේෂයක් වසර 04 ක කාලයක සිට අය කර නොතිබුණි. | මෙම නිලධාරීන්ගෙන් වර්තමාන සේවා ස්ථානය සොයා ණය අය කර ගැනීමට කටයුතු කරන බව | සභාවට අය විය යුතු සේවක ණය අය කර ගත යුතුය |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන නොතිබුණු අතර, තිරසර සංවර්ධන සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා කටයුතු කරන බව | අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය |